මගේ අංකය: බප/සසේකො/ලේ.නි.

සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.

මහලේකම් කාර්යාලය,

03 වන මහල,

මාළිගාවත්ත,

කොළඹ 10.

1996.03.12.

චක්‍රලේඛ අංක : 1/96

බස්නාහිර පළාතේ සියළුම
සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

## තනතුරුවලට පත්කිරීම් සඳහා අනුමැතිය ඉල්ලීම

සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම් සඳහා අනුමැතිය ඉල්ලා කොමිෂන් සභාවට ඉල්ලීම් ඉදිරිපත් කරන අවස්ථාවලදී පහත සඳහන් ලියවිලි/වාර්තා සමග එකී ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා කඩිනමින් තීරණයන්ට එළඹිය හැකිවනු ඇත.

එහෙයින් මින් ඉදිරියට තනතුරුවලට පත්කිරීම් සඳහා අනුමැතිය ඉල්ලා එවීමේදී එකී ලියවිලි ද ඉදිරිපත් කිරීමට පියවර ගන්නා මෙන් කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වා සිටිමි.

1. පුරප්පාඩු පිරවීමට අනුමැතිය දෙන ලද බස්නාහිර පළාතේ සමුපකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් ගේ ලිපියේ පිටපත.
2. අනුමත පිරිස් බල තක්සේරුවේ පිටපත.
3. පුරප්පාඩුව පිරවීමට අයදුම්පත් කැඳවන ලද දැන්වීමේ සහතික කරන ලද පිටපත
4. ලැබී තිබුනු ඉල්ලුම්පත් උප ලේඛනය.
5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව
6. ලැබී තිබුනු ඉල්ලුම්පත්වල පිටපත් ( මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු සඳහා වන ඉල්ලුම්පත් පමණි.)
7. තෝරාගත් අයදුම්කරු පත්කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලැබූ තීරණය.
8. ආකෘති පත්‍ර අංක 01 වාර්තාව.

මෙයට,
කොමිෂන් සභාවේ නියමය පරිදි,

(පී.ඩී. චන්ද්‍රදාස)

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

1. ලේකම්, සෞඛ්‍ය, සමුපකාර හා වනිතා
 - කටයුතු අමාත්‍යාංශය
2. ස.සං.කො.රේ.(බ.ප.)
3. සහකාර ස.සං.කො. - කොළඹ, කළුතර, ගම්පහ
4. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් ...